**මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගම - 2016**

**----------------------------------------------------------------**

මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය කරගෙන යාම සඳහා ප්‍රසිද්ධ වෘත්තියේ යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය. සමාගමට අදාළ විස්තරාත්මක වාර්තාවක් සමාගමේ සභාපතිවරයා වෙත 2017 අගෝස්තු 09 වන දින නිකුත් කරන ලදී.

### 1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 **විගණකගේ වගකීම**

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 **අහිතකර මතය සඳහා පදනම**

**-----------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 අහිතකර මතය

------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

--------------------------------

2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අලාභය රු.1,960,685,373 ක් වූ අතර මේ හේතුවෙන් එදිනට සමාගමේ ශුද්ධ වත්කම් රු.1,885,685,373 ක සෘණ අගයක් ගෙන තිබීමෙන් එදිනට සමාගම බරපතල ලෙස ප්‍රාග්ධන හිඟයකට මුහුණ දී තිබුණි. ඒ අනුව 2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වන වගන්තිය ප්‍රකාරව දින 20 ක් ඇතුළත කොටස් හිමියන්ගේ අතිවිශේෂ මහා සභා රැස්වීමක් කැඳවා ඉහත කරුණ පිළිබඳව දැනුවත් කළ යුතු වුවත්, අධ්‍යක්ෂ මණ්ඩලය එපරිදි කටයුතු කිරීමට අපොහොසත් වී තිබුණි. කෙසේ වුවද, සමාගම තම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේ දී අඛණ්ඩ පැවැත්මක් ඇත යන උපකල්පනය මත පිහිටා කටයුතු කර තිබූ නමුදු තවදුරටත් මව් ආයතනය වන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය සහයෝගය එහි මෙහෙයුම් කටයුතු හා වගකීම් පියවීමට අදාළව ලබා දෙන බවට තහවුරුවක් ලබාගෙන නොතිබුණි.

#### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

--------------------------------

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

-----------------------------------

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 ප්‍රකාරව රු.2,931,386,743 ක් වූ ණය, ජංගම හා ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වීම වෙනුවට ජංගම නොවන වගකීම් යටතේ පමණක් දක්වා තිබුණි. ප්‍රමිතය ප්‍රකාරව ජංගම වගකීම් ලෙස වර්ගීකරණය සිදු කළේනම් සමාගමේ ශුද්ධ ජංගම වත්කම් සෘණ අගයක් විය යුතුව තිබුණි. තවද මෙම ණය ශේෂය සඳහා බැංකුවෙන් ශේෂ සනාථ කිරීමක්ද ලැබී නොතිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වරාය අංගනය තුළ දින 07කට වැඩි කාලයක් රඳවා තබාගෙන තිබූ වාහන 243 කට අදාළව අයකලයුතු බිම් කුලිය වන රු.197,888,250 ක මුදල අයකර ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණු අතර එයින් සමාගම වෙත ලැබිය යුතු සියයට 40 වන කොටස ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව තිබූ අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පවතින රු.මිලියන 25.7 ක් වූ ලැබිය යුතු ටග් යාත්‍රා වන්දි (Tug Claim Receivables) මුදල සඳහා තෙවන පාර්ශව ශේෂ සනාථ කිරීම් ලැබී නොතිබුණු අතර අනාගතයේ සිදුවිය හැකි හානිකරණ පාඩු (Impairment Loss) සඳහා ප්‍රතිපාදන ද මූල්‍ය ප්‍රකාශනවල සලසා නොතිබුණි.

**2.2.4 පැහැදිලි නොකල වෙනස්කම්**

2016 දෙසැම්බර් 31 දිනට අයිඑෆ්ඕ 380 (IFO 380) හා එම්ජීඕ (MGO) යන තෙල් වර්ග දෙකෙහි පොත් වල දැක්වෙන තොග ශේෂය සහ තොග සත්‍යාපන වාර්තා අනුව භෞතික ශේෂය අතර පිළිවෙලින් මෙට්‍රික් ටොන් 1,264 ක හා මෙට්‍රික් ටොන් 1,647 ක වෙනස්කම් දක්නට ලැබුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

පහත සඳහන් එක් එක් විෂයයක් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකිවිය.

| | විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| 01. | නැව් තෙල් තොග කපා හැරීම | 585,496,943 | අධ්‍යක්ෂ මණ්ඩල තීරණ |
| 02. | අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කැට (Interlock Concrete Blocks) | 1,761,247 | තොග සත්‍යාපන වාර්තා |
| 03. | කොන්ක්‍රීට් ගල් | 3,989,926 | තොග සත්‍යාපන වාර්තා |
| 04. | ඉන්ධන තොග | 2,658,595 | තොග සත්‍යාපන වාර්තා |

**2.3 නීති ,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 396 | බැංකු ජංගම ගිණුමකට අදාළව මාස 06 ඉක්මවා තිබූ වටිනාකම රු. 118,389 ක් වූ චෙක්පත් 4 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

---------------------------------------

| | |
|---|---|
| (i) 5.1.1 වගන්තිය | සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින්ම සංයුක්ත සැලැස්මක් (Corporate Plan) පිළියෙල කළයුතු වුවත් සමාගම එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| (ii) 5.1.2 වගන්තිය | සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින්ම සංයුක්ත සැලැස්මට අනුගත ක්‍රියාකාරී සැලැස්මක් (Action Plan) පිළියෙල කළයුතු වුවත් සමාගම එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| (iii) 7.2 වගන්තිය | ආයතනයේ පාලන පරිසරයේ ප්‍රධාන අංගයක් ලෙස සියලු ප්‍රධාන මෙහෙයුම් ආවරණය වන පරිදි සකස් කරන ලද මෙහෙයුම් අත්පොතක් (Procedure Manual /System ) පිළියෙල කළ යුතු වුවත් සමාගම එවැනි මෙහෙයුම් අත්පොතක් සකස් කර නොතිබුණි. |
| (iv) 7.4.1 වගන්තිය | විගණන කමිටුව රැස් වී අභ්‍යන්තර විගණනයෙන් සොයාගත් කරුණු මත පදනම්ව ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය හා මෙහෙයුම් කටයුතු වැඩි දියුණු කිරීමට අදාළ නිර්දේශ ලබාදිය යුතු වුවත්, සමාගමේ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර විගණන කමිටු රැස්වීම් ද පවත්වා නොතිබුණි. |
| (v) 8.5 වගන්තිය | මාගම්පුර වරාය පරිශ්‍රයේ පිහිටි රු.9,744,499,541 ක් වටිනා තෙල් ටැංකි සංකීර්ණයේ වටිනාකම ආවරණය වන පරිදි හානි අවදානම අවම කර ගැනීම සඳහා රක්ෂණ ආවරණයක් ලබාගෙන නොතිබුණි. තෙල් ටැංකි සංකීර්ණයේ හිමිකරු වරාය අධිකාරිය වුවද වරාය කළමනාකරණ සමාගම ලෙස මාගම්පුර වරාය කළමනාකරණ සමාගම මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබුණි. |
| (vi) 9.3.1 වගන්තිය | සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින් සෑම තනතුරක් සඳහාම විධිමත් බඳවා ගැනීමේ පටිපාටියක් (Schemes of Recruitment) පිළියෙල කර ඒ සඳහා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගත යුතු වුවත්, සමාගම විසින් එවැනි බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර අදාළ පාර්ශවයන්ගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |

3. **මූල්‍ය සමාලෝචනය**

----------------------

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 535 ක අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.මිලියන 449ක් වුයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ අලාභය රු.මිලියන 86කින් වැඩි වී තිබුණි. මේ සඳහා රු.585,496,943 ක නැව් තෙල් තොගයේ හානිකරණය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 3ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2013 වර්ෂයේ රු.7,991,434 ක ශුද්ධ ලාභයක් වී තිබුණ ද 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අඛණ්ඩව අලාභ ඇති වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ රු.27,657,651 ක හිතකර දායකත්වයක් ඇති වී තිබුණි. එහෙත්, 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම දායකත්වය සෘණ අගයක් ගෙන තිබූ අතර එය පිළිවෙලින් රු.763,106,656 ක් රු.28,954,245 ක් සහ රු.94,343,252 ක් වී තිබුණි.

**3.2** **විග්‍රහාත්මක සමාලෝචනය**

--------------------------------

2015 වර්ෂයේ දී ශුද්ධ ලාභ අනුපාතය සියයට සෘණ 29 ක් වූ අතර එය 2016 වර්ෂයේ දී සියයට සෘණ 66 ක් දක්වා පිරිහී තිබූ අතර සමාගමේ ලාභදායීත්වය හා කාර්යක්ෂමතාවය ඉතාම පහළ මට්ටමක පැවතුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**4.1** **කාර්යසාධනය**

----------------

පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා සමාගම පිහිටුවා තිබුණි.

(අ) ශ්‍රී ලංකා වරාය අධිකාරිය, සමාගම වෙත කලින් කලට පවරනු ලබන රාජකාරී හා කාර්යයන් ඉටු කිරීම, මාගම්පුර වරාය කළමනාකරණ හා මෙහෙයුම් කටයුතු සිදු කිරීම.
(ආ) නවීන ජාත්‍යන්තර මුහුදු වරායක් ලෙස හම්බන්තොට මහින්ද රාජපක්ෂ වරාය සංවර්ධනය කිරීම.
(ඇ) හම්බන්තොට මහින්ද රාජපක්ෂ වරාය සීමාව තුළ කාර්මික කලාපයක් ඇති කිරීම.
(ඈ) නාවික යාත්‍රා වලට නැව් තෙල්, ජලය සහ අනිකුත් සේවා සැපයීම.

කෙසේ වුවද, ඉහත අරමුණු අතුරින් හම්බන්තොට වරාය සීමාව තුළ කාර්මික කලාපයක් ඇති කිරීම ප්‍රධාන අරමුණක් වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම අරමුණ ඉටු කරගෙන නොතිබුණි.

**4.2** **කළමනාකරණ ක්‍රියාකාරකම්**

--------------------------------

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ (Articles of Association) සඳහන් අරමුණුවලට අයත් නොවන කාර්යයක් වූ අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි( Interlock Blocking ) සහ ගල් කඩන යන්ත්‍ර (Crusher) මෙහෙයුම් කටයුතු සමාගම විසින් පවත්වාගෙන ගොස් තිබුණි. එම ක්‍රියාකාරකම් වලින් 2014 වර්ෂයේ දී රු.5,375,253 ක දළ අලාභයක් සහ 2015 සහ 2016 වර්ෂවලදී පිළිවෙලින් රු.4,149,757 ක් හා රු.753,558 ක දළ ලාභ උපයා තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේදී තෙල් මෙහෙයුම් ආදායම රු. 9,605,884 ක් පමණක් වී තිබූ අතර අදාළ කාලය තුළ රු.585,496,943 කින් තොග අගය අඩුවීම වීම, නැව් තෙල් මෙහෙයුම් සඳහා සෘජු වියදම් රු.30,537,384 ක් වීම, ණය පොලී රු.119,395,460 ක් ගෙවීම හා පරිපාලන වියදම් හා වෙනත් වියදම් රු.116,258,416 ක් වශයෙන් එකතුව රු. 851,688,203 ක් වියදම්කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දී රු. 842,082,319 ක ශුද්ධ අලාභයක් ඇති වී තිබූ අතර නැව් තෙල් අලෙවිය ආරම්භ කල 2014 අප්‍රේල් 25 වන දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා තෙල් අලෙවියට අදාළ මෙහෙයුම් කටයුතු මගින් රු. 2,718,638,138ක සමස්ත මෙහෙයුම් අලාභයක් සිදුවී තිබුණි. අතැති නැව් තෙල් තොගය මෙට්‍රික් ටොන් 10,419 ක් තිබියදී මෙට්‍රික් ටොන් 7,368 ක තොගයක් නැවත මිලදී ගැනීම හා ඒවා නොවිකිණී පැවතීම හේතුවෙන් මුළු නැව් තෙල් තොග හානිකරණ අලාභය වැඩිවීම මෙහෙයුම් අලාභය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. කෙසේ වුවද , 2016 වර්ෂයේදී වරායේ නැව් තෙල් මෙහෙයුම් කටයුතු නතර කර තිබුණි.

(ආ) මාගම්පුර වරාය කළමනාකරණ සමාගම විසින් රජයේ විගණනය වෙත අංක GM/MPMC/399 දරන 2016 ජුලි 20 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපිය අනුව 2016 ජුනි 30 දිනට මැරයින් ගෑස් ඔයිල් (MGO) මෙට්‍රික් ටොන් 14,582 ක් වූ තෙල් තොගයක කාලය ගතවීමත් සමග වර්ණය වෙනස් වී ඇති බව දන්වා තිබුණි. ඒ අනුව එම තෙල් තොගය විකිණීමේ දී ගැටළු ඇතිවිය හැකි බව හා පාඩු ඇති විය හැකි බව විගණනයේ දී නිරීක්ෂණය විය.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------------

1879 අංක 35 දරන රේගු ආඥා පනතේ (සංශෝධිත 235 වන අධිකාරිය) 69 සහ 135 වන වගන්තිය ප්‍රකාරව දැනට ගබඩාවේ පැවති නැව් තෙල් තොගය සම්බන්ධයෙන් රේගුවට ගෙවිය යුතු බදු වගකීම් වලට අදාළව රු.මිලියන 220 ක බැංකු ඇපකරයක් හැකි ඉක්මනින් රේගුව වෙත ඉදිරිපත් කරන ලෙස මාගම්පුර වරාය කළමනාකරණ සමාගම වෙත දන්වා තිබූ නමුත් එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.ඒ හේතුවෙන්, ශ්‍රී ලංකා රේගුව විසින් මාගම්පුර වරාය කළමනාකරණ සමාගමෙහි සාමාන්‍යාධිකාරිවරයා අමතන ලද 2016 පෙබරවාරි 02 දිනැති අංක INDS/PRJ/0004/2016 දරන ලිපිය අනුව පිළිගත් ඇපකරයක් ඉදිරිපත් කිරීමෙන් තොරව වසර 2කට වැඩි කාලයක් තෙල් තොග පවත්වා ගෙන යාම, රේගු ආඥා පනතේ 135 වගන්තිය උල්ලංඝණය කිරීමක් බව දක්වමින් තහනම් නියෝගයක් පනවා රු. 1,975,057,705 ක් වටිනා නැව් තෙල් මෙට්‍රික් ටොන් 17,210 ක් අනවසරයෙන් පවත්වා ගෙනයාම සම්බන්ධයෙන් රේගු විමර්ශණයක් ආරම්භ කර තිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

2015 වර්ෂයේ දී වරාය කළමනාකරණ සමාගම විසින් නැව් තෙල් මෙහෙයුම් කටයුතු නැවැත්වීමට තීරණය කිරීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුළු වත්කම් වටිනාකම වූ රු. 9,744,499,541කින්, සියයට 71.7 ක් වූ රු. 6,987,638,384ක වටිනාකමකින් යුත් තෙල් ටැංකි 9ක් හා ඊට අදාළ පරිවහන පද්ධතිය තෙල් අලෙවි කටයුතු නතර කළ දින සිට ඌන උපයෝජිතව පැවතුනි.

## 4.6 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

මාගම්පුර වරාය කළමනාකරණ සමාගමේ සංවිධාන සටහන (සේවක සංඛ්‍යාව) තුළ ඇතුළත් නොවූ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තෙල් ගුදම් කටයුතු) තනතුරක් ඇති කර නැව් තෙල් මෙහෙයුම් කටයුතු විධිමත් කිරීම සඳහා 2013 දෙසැම්බර් 02 දින සිට බලපැවැත්වෙන පරිදි උපදේශකයෙකු බඳවාගෙන තිබුණි. මෙම උපදේශකවරයාගේ සේවය ලබා ගැනීම 2015 දෙසැම්බර් 18 දිනැති කළමණාකරන

අධ්‍යක්ෂකගේ ලිපිය මගින් අවසන් කර තිබූ අතර 2016 ජනවාරි 20 දින සේවය නතර කරන අවස්ථාව දක්වා වැටුප් හා දීමනා ලෙස එකතුව රු. 19,837,500 ක් ද ඉන්ධන හා අධිවේගී මාර්ග ගාස්තු සහිත වාහන පහසුකම් සැපයීම සඳහා රු. 989,483 ක් ද වශයෙන් එකතුව රු. 20,826,983 ක් ගෙවීම් කර තිබුණි. මෙසේ උපදේශක සේවාව ලබාගෙන තිබූ කාලපරිච්ඡේදයේ දී නැව් තෙල් මෙහෙයුම් කටයුතු මගින් රු. 1,876,555,819 ක අලාභයක් ලබා තිබීම හේතුවෙන් එම සේවාව වෙනුවෙන් දරා තිබූ වියදම අනාර්ථික වියදමක් බව විගණනයේ දී බැහැර කල නොහැකි විය. තවද , එම උපදේශකවරයා විසින් සේවය අත්හිටුවීමට විරුද්ධව රු.මිලියන 100ක වන්දියක් ඉල්ලා සමාගමට එරෙහිව නඩුවක් ද පවරා තිබූ අතර දැනට එය අධිකරණයේ විභාග වෙමින් පැවතුනි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම

හම්බන්තොට වරාය ඉදිකිරීම් කටයුතු සිදු කිරීමේ දී කඩා ඉවත් කරන ලද කළු ගල් හා පස් තැනින් තැන ස්ථාන ගතකර තිබූ අතර වරාය පරිශ්‍රය තුළ ජලය එකතු වන ආකාරයේ වලවල් ද සෑදී තිබුණි. තවද වරාය සංවර්ධන කටයුතු සඳහා අත්පත් කර ගන්නා ලද ඉඩම්වල කඩා දමන ලද ගොඩනැගිලි සුන්බුන් කොටස් ද ඉතිරි වී තිබුණි. මේ පිළිබඳව හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් 2017 පෙබරවාරි 08 වන දින නිකුත් කරන ලද අංක HDS/LND/12/F/1 දරන ලිපිය මගින් හම්බන්තොට ප්‍රදේශය තුළ පවතින වැසි තත්ත්වය මත මෙම ඉඩම් තුළ ඩෙංගු අවදානම් කලාපයක් ලෙසට වර්ධනය වෙමින් පවතින බවට මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් හඳුනාගෙන ඇති බවත් මෙම ගැටළුකාරී තත්ත්වය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසටත් වරාය අධිකාරිය දැනුවත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් අංක SPD/H/02/09 හා 2017 පෙබරවාරි 06 දිනැති වරාය අධිකාරියේ ලිපිය මගින් ඊට අවශ්‍ය පියවර ගන්නා ලෙසට මාගම්පුර වරාය කළමනාකරණ සමාගම දැනුවත් කර තිබූ නමුත් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට විගණිත දිනය වූ 2017 අප්‍රේල් 30 දින වන විට ද අපොහොසත් වී තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | සේවක මණ්ඩල කළමනාකරණය | බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කර නොගැනීම. |
| (ආ) | අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා අභ්‍යන්තර විගණනය සිදුකිරීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | තොග පාලනය | භාවිතයට ගත නොහැකි තොග සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු නොකිරීම. |
| (ඈ) | වත්කම් පරිපාලනය | ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු නොකිරීම. |